# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැළැක්වීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 අප්‍රේල් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ :** රු. 12.25 යි. **තැපැල් ගාස්තුව :** රු. 7 .50 යි.

**2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැළැක්වීමේ පනත**

[සහතික සටහන් කළේ 2007 අප්‍රේල් මස 11 වන දින]

එල්. ඩී.— ඕ. 98/ 2002.

**මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ මදුරුවන් බෝවන ස්ථාන තුරන් කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

ඩෙංගු උණ සහ ඩෙංගු රක්තපාත උණ සෑදුන පුද්ගලයන්ගේ සංඛ්‍යාව සහ එම රෝගවලින් මියයන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩිවීමත් සමගම ශ්‍රී ලංකාව තුළ ඩෙංගු උණ සහ ඩෙංගු රක්තපාත උණ උග්‍ර මහජන සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට පත් වී ඇති හෙයින් ද :

මෙම බරපතල රෝගය වැළැක්වීම සඳහා එන්නතක් මෙවකට නොමැති හෙයින් ද, එමෙන්ම මෙම රෝගය සුව කිරීම සඳහා යම් නිශ්චිත ප්‍රතිකර්මයක් නොමැති හෙයින් ද :

මෙම රෝගය පැතිරීම වැළැක්වීමේ සහ පාලනය කිරීමේ එකම ක්‍රමය මෙම රෝගය පතුරුවන මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම වන හෙයින් ද :

ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම මගින් සහ එම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම උදෙසා නිසි බලධරයකු සහ වෙනත් නිලධරයන් පත්කිරීම මගින් මෙම සෞඛ්‍ය ප්‍රශ්නය පිළිබඳව ජාතික ආකල්පයකින් ඵලදායී ලෙස ක්‍රියා කිරීමට අවශ්‍යව ඇති හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1**. මේ පනත 2007 අංක 11 දරන මදුරුවන් බෝවීම වැළැක්වීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මදුරුවන් බෝවීමට හිතකර තත්ත්වයන් ඇති කිරීමට එරෙහිව තහනම.

**2**. මදුරුවන්ගෙන් බෝවන සියලුම රෝග වැළැක්වීම සහ තුරන් කිරීම සහතික කිරීමේ කාර්ය සඳහා—

(අ) යම් පරිශ්‍රයක හෝ එය ඇතුළත ඇති, ජලය රැඳී තිබිය හැකි විවෘත ටින්, බෝතල්, පෙට්ටි, පොල් කටු, පොල් කෝම්බ, ටයර් හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ භාජනයක් ඉවත් කිරීමට, විනාශ කිරීමට හෝ අන්‍යාකාරයකින් ප්‍රයෝජනවත් ලෙස බැහැර කිරීම;

(ආ) පීලි, ජලය බැස යන පයිප්ප සහ කාණුවලින් ජලය මනා ලෙස ගලායන පරිදි සියලු බාධක ඉවත් කිරීම ;

(ඇ) මදුරුවන් බෝවීම වළක්වන පරිදි ජල භාජන, වතුර ටැංකි, වායු සමීකරණ යන්ත්‍ර සහ ජලය රඳවා ගැනීමේ වෙනත් භාජන වසා සහ ආවරණය කොට යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම ;

(ඈ) පරිශ්‍රයෙහි පිහිටා ඇති යම් ලිඳක් සහ එහි අවට යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යමින් එය මදුරුවන් නොසිටින තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහ එමගින් මදුරුවන් බෝවීම වැළැක්වීම ;

(ඉ) එම පරිශ්‍රයේ ඇති යම් කෘත්‍රිම ජලාශයක් හෝ තටාකයක් සෑම සතියකට ම වරක් ඉසීම ;

(ඊ) මදුරුවන් බෝවීමට පාදක විය හැකි පරිශ්‍රය තුළ අහම්බෙන් එකතුවන ජලය, නිරන්තරයෙන්ම ගලා යෑමට සැලැස්වීම ;

(උ) ආහාර සඳහා හෝ අලංකාරය සඳහා වගා කරනු ලබන ගස්වැල් හැර, නේවාසික ස්ථානයක් වශයෙන් භාවිත කරනු ලබන යම් පරිශ්‍රයක් තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් ඇතුළත හෝ පිටත පිහිටියා වූ ද, මදුරුවන් බෝවීමේ ස්ථානයක් බවට පත් වී ඇත්තා වූ ද, පඳුරු, යම් අකුලු සහ වෙනත් සියලුම වර්ගවල ගහකොළ ඉවත් කිරීම ;

(ඌ) “පිස්ටියා ස්ට්‍රැටියෝටිස්” නමති උද්භිද විද්‍යාත්මක නාමය ඇති “දිය පරඬැල්”, “කොන්ඩෙපාසි”, “තෙල්පාසි”, “බරවා පාසි”, “නානායවිරද්ධි” යන නම් වලින් සාමාන්‍යයෙන් දේශීයව හඳුන්වනු ලබන මදුරුවන් බෝවීමට පාදක වන ජලජ ශාඛ සහ වෙනත් ජලජ ශාඛා හෝ ශාඛයන් ඉවත් කර විනාශ කිරීම ;

(එ) යම් අදාළ බලධාරියකුගේ අනුමතය ලබාගැනීමෙන් අනතුරුව සුදුසු බාධක ඉදිකිරීම මගින් ඉහත (ඌ) ඡේදයේ සඳහන් යම් ජලජ ශාඛයක්, දියපාරක් මත පාවී යාම නැවැත්වීම තුළින් එම ශාක පැතිරීම වැළැක්වීම ; සහ

(ඒ) පරිශ්‍රය තුළ හෝ ඇතුළත මදුරුවන් බෝවීමට හිතකර වෙනත් යම් පසුබිමක් ඉවත් කිරීම හෝ වැළැක්වීම,

යම් පරිශ්‍රයක සෑම අයිතිකරුවකුගේම හෝ පදිංචිකරුවකුගේම කාර්යය විය යුතු ය.

ඇතැම් පියවර ගන්නා ලෙස අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකි බව.

**3**. (1) යම් පරිශ්‍රයක් හෝ එය තුළ තබා ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් දෙයක් මදුරුවන් බෝවීමට හිතකර වී ඇති බවට නිසි බලධරයාට පෙනී යන අවස්ථාවක, නිසි බලධරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් පහත දැක්වෙන පියවරවලින් පියවර එකක් හෝ ඊට වැඩි ගණනක් එම ලිඛිත දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත අනුගමනය කරන ලෙස හෝ ගන්නා ලෙස එම පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය :—

(අ) යම් පරිශ්‍රයක් තුළ ඇති ගොඩනැගිලිවල සියලුම පීලි, ජලය බැස යන පයිප්ප සහ කාණු අලුත්වැඩියා කිරීම ;

(ආ) යම් පරිශ්‍රයක ඇති වැසිකිළි වතුර රැස්කිරීම සඳහා වූ ටැංකි, වතුර ටැංකි හෝ කෘත්‍රිම පොකුණු, එහි වූ ජලය කලින් කල ඉවත් කළ හැකි පරිදි ඒවා ඉදි කිරීම හෝ නැවත ඉදි කිරීම ;

(ඇ) යම් පරිශ්‍රයක ඇති යම් වැසිකිළි වතුර රැස්කිරීම සඳහා වූ ටැංකියකින්, වතුර ටැංකියකින් හෝ ජලාශයකින් තාවකාලිකව ජලය ඉවත් කොට ඒවා පිරිසිදු කිරීම සහ පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒවා තවදුරටත් භාවිත නොකරනු ලබන විට ඒවා වසා දැමීම ;

(ඈ) මදුරුවන් බෝවීම වළක්වන ආකාරයකින් පරිශ්‍රයක ඇති යම් ළිඳක් පවත්වාගෙන යාම ;

(ඉ) ජලය එකතුවීමට සහ පල්වීමට ඉඩ ඇති යම් කැණීමකින් හටගත් වලක්, භාවිත නොකරන ළිඳක්, වැසිකිළි වලක්, පොකුණක් හෝ වෙනත් යම් ස්ථානයක් පිරවීම, එහි ජලය ඉවත් කිරීම හෝ ඊට මදුරු නාශක බෙහෙත් ඉසීම ;

(ඊ) යම් පරිශ්‍රයක් තුළ ඇති වලවල් සහ පහත් බිම් ප්‍රදේශ පිරවීම ;

(උ) යම් පරිශ්‍රයක ඇති වගුරු බිම් සහ දිය කඩිති සහ ජලය එකතුවන ස්ථාන පිරවීම හෝ ඒවායින් ජලය ඉවත් කිරීම හෝ සතියකට වරක් මදුරු නාශක බෙහෙත් ඉසීම ;

(ඌ) "පිස්ටියා ස්ට්‍රැටියෝටිස්" නමැති උද්භිද විද්‍යාත්මක නාමයෙන් ද සාමාන්‍යයෙන් දේශීයව "දිය පරඬැල්", "කොන්ඩෙපාසි", "තෙල්පාසි", "බරවාපාසි" හෝ "නානායව්රද්ධි" යන නම්වලින් හැඳින්වෙන මදුරුවන් බෝවීමට පහසුකම් සළසන බවට සොයා ගනු ලැබ ඇති ජලජ ශාඛ හෝ වෙනත් යම් ජලජ ශාඛයක් හෝ ශාඛ, ඉවත් කිරීම, උදුරා දැමීම සහ විනාශ කිරීම ;

(එ) (ඉ) ඡේදයේ සඳහන් යම් ජලජ ශාඛයක් සුදුසු බාධක ඉදිකිරීම මගින් යම් ජල පාරක් මත පාවී යාම නැවැත්වීම තුලින් එම ශාඛය පැතිරීම වැළැක්වීම ; සහ

(ඒ) නිසි බලධරයා හෝ තත්කාර්ය සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් පියවර ගැනීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ලිඛිත දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත එම දැන්වීමට අනුකූලව ක්‍රියාකිරීමට අයිතිකරු හෝ පදිංචිකරු අතපසු කරන විට හෝ පැහැර හරින විට, දැන්වීමේ සඳහන් පියවර ගැනීමට නිසි බලධරයාට සිදුවන බවත්, එසේ පියවර ගැනීමේ දී දැරීමට සිදුවන යම් වියදම් එම අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු බවටත්, (1) වන උපවගන්තියේ සඳහන් ලිඛිත දැන්වීම මගින් තවදුරටත් දැනුම් දෙනු ලැබිය යුතු ය.

2 වන හෝ 3 වන වගන්ති මගින් පනවා ඇති නියමයන්ට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැරීම වරදක් බව.

4. (1) මේ පනතේ 2 වන හෝ 3 වන වගන්ති මගින් පනවා ඇති යම් නියමයක් හෝ පවරන ලද කාර්යයක් උල්ලංඝනය කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සෑම අයිතිකරුවකු ම හෝ පදිංචිකරුවකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් එක් දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට සහ වරදකරු කිරීමෙන් පසු එම වරද අඛණ්ඩව සිදු කරන විට, එසේ එම වරද සිදු කරන එක් එක් දිනය සඳහා රුපියල් සියයක් බැගින් වූ දඩයකට ද, ඔහු යටත් වන්නේ ය :

එසේ වුවද, එම වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැති බවට හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා නිසි සැලකිල්ලෙන් සහ උද්යෝගයෙන් ක්‍රියා කළ බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන ආකාරයට එම අයිතිකරු හෝ පදිංචිකරු ඔප්පු කරන්නේ නම්, එම අයිතිකරු හෝ පදිංචිකරු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දඩ මුදල පැනවීමට අමතරව, මේ පනතේ 2 වන වගන්තිය මගින් පවරා ඇති කාර්යයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මත වරදකරුවකු කරනු ලැබූ විටක දී, එම කාර්යයන්ට අනුකූලව ක්‍රියාකරමින් මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා උචිත යයි මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන වැළැක්වීමේ හෝ නිවැරදි කිරීමේ පියවර ගන්නා ලෙස, එම අයිතිකරුට හෝ පදිංචිකරුට මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

නිසි බලධරයා විසින් වැඩ සිදු කළ යුතු බව හෝ පියවර ගත යුතු බව.

**5**. (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් පරිශ්‍රයක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු වෙත ද, එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ සඳහන් කාලය ඇතුළත එහි නිශ්චිතව දැක්වෙන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ එසේ ක්‍රියා කිරීම අතපසු කරන අවස්ථාවක, දවසේ යම් සාධාරණ වේලාවක් තුළ දී එම පරිශ්‍රයට ඇතුළු වී, එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් පැහැර හැර ඇති හෝ අතපසු කොට ඇති දැන්වීමේ නිශ්චිතව දැක්වෙන කටයුතු ඉටු කිරීම සඳහා හෝ පියවර ගැනීම සඳහා නිසි බලධරයා විසින් අවස්ථාවෝචිත පරිදි, යම් නිලධරයකුට හෝ නිලධරයන්ට ලිඛිතව බලය පවරනු ලැබිය හැකි ය. මෙම උපවගන්තිය යටතේ යම් කටයුත්තක් ඉටුකිරීම ආරම්භ කිරීම හෝ යම් පියවරක් ගැනීමට පෙර, එසේ එම කටයුත්ත ඉටු කිරීමට හෝ පියවර ගැනීමට නිසි බලධරයා විසින් එම නිලධරයාට හෝ නිලධරයන්ට බලය පවරමින් නිකුත් කරන ලද ලේඛනයේ පිටපතක් එම අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ පෙන්විය යුතු වන්නේ ය.

(2) නිකුත් කරනු ලැබූ ලිඛිත දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට එරෙහිව මේ පනතේ (4) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා නඩු පවරනු ලැබීම, (1) වන උපවගන්තියේ අන්තර්ගත කිසිවක් මගින් වළක්වනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් කටයුත්තක් ඉටු කරනු ලැබූ හෝ පියවරක් ගනු ලැබූ අවස්ථාවක, පිරිවැය වශයෙන් දරන ලද යම් මුදලක්, එම මුදල ගෙවන ලෙස අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් ඉල්ලා සිටිනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත, එම අයිතිකරු හෝ පදිංචිකරු විසින් නිසි බලධරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ යම් මුදලක් ගෙවීමට හෝ අයවීමට ඇත්තේ යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් ද, එම පරිශ්‍රයේ අයිතිකරු විසින් මුදල ගෙවීමට පෙර එම පරිශ්‍රය විකුණන හෝ පවරන අවස්ථාවක, එසේ පරිශ්‍රය විකිණීම හෝ පැවරීම නොතකා එම අයිතිකරු එම මුදල ගෙවීමට දිගටම යටත්ව සිටිනු ලබන්නේ ය.

5 වන වගන්තිය යටතේ පිරිවැය වශයෙන් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම.

**6**. (1) 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මුදල් ගෙවන ලෙස ඉල්ලා සිටීම තමා වෙත දැනුම් දී සති දෙකක් ඇතුළත එම මුදල් ගෙවීම අයිතිකරු හෝ පදිංචිකරු විසින් පැහැර හරින අවස්ථාවක, එම කටයුතු ඉටු කිරීමේ දී හෝ පියවර ගැනීමේ දී දරන ලද වියදම් වශයෙන් අයවිය යුතු මුදල පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක්, නිසි බලධරයා විසින් එම පරිශ්‍රය පිහිටි ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල අයකර ගැනීම සඳහා තමාට එරෙහිව තවදුරටත් නීති කෘත්‍ය සිදු නොකළ යුත්තේ මන්ද යන්න පෙන්වීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, එම අයිතිකරු හෝ පදිංචිකරු තමා ඉදිරිපිටට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතුවක් නොපෙන්වීමේ දී එම මුදල, දඩයකින් පමණක් දඬුවම් කළ හැකි හෝ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ නොහැකි වරදක් සම්බන්ධයෙන්, මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයක් මගින් එම අයිතිකරු හෝ පදිංචිකරු වෙත පවරනු ලබන දඩ මුදලක් ලෙස, සලකනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිසි බලධරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ පිළිබඳ දැන්වීමක් අදාළ අයිතිකරු හෝ පදිංචිකරු වෙත ද නිකුත් කරනු ලැබිය යුතු ය. අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු වෙත නිකුත් කරන ලද දැන්වීමක් ඔහු වෙත නොලැබීමේ හේතුවෙන් මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයක් බලරහිත නොවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යයක දී නිසි බලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති නිරවද්‍යතාවය සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට මේ වගන්තියේ සඳහන් කිසිවක් මගින් මහෙස්ත්‍රාත්වරයකුට බලය පැවරීමක් හෝ නියම කිරීමක් හෝ නොකළ යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ දඩයක් ලෙස පනවන ලද යම් මුදලක්, මහෙස්ත්‍රාත්වරයා විසින් නිසි බලධරයා වෙත යවනු ලැබිය යුතු ය.

පළිබෝධ නාශක ඉසීම.

7. (1) නිසි බලධරයා විසින් යම් පරිශ්‍රයක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු වෙත ලිඛිතව යවනු ලබන දැන්වීමක් මගින්, එම දැන්වීමේ සඳහන් පළිබෝධ නාශක වර්ගය එහි සඳහන් කාලය ඇතුළත දී ජලය එකතුවන සහ මදුරුවන් බෝවන බවට සොයා ගෙන ඇති යම් පොකුණකට, ජල භාජනයකට, ජලාශයකට හෝ වෙනත් යම් ස්ථානයකට ඉසින ලෙස, එම අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) නියමිත කාලය ඇතුළත දී (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීම මේ පනත යටතේ වූ වරදක් වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, එම අයිතිකරු හෝ පදිංචිකරු රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

නිසි බලධරයා යනාදීන්ට විරෝධය පෑම හෝ බාධා කිරීම.

**8.** (1) නිසි බලධරයා හෝ මේ පනත යටතේ ඔහුගේ කාර්ය හෝ කර්තව්‍ය කිරීමට හෝ ඉටු කිරීමට බලය පවරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් එම කාර්ය හෝ කර්තව්‍ය නීත්‍යානුකූල ලෙස කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී කිසිම අයිතිකරුවකු, පදිංචිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් දැන දැනම හෝ සිතාමතා නිසි බලධරයාට හෝ එසේ බලය පවරන ලද වෙනත් තැනැත්තකුට විරෝධය පෑම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් අයිතිකරුවකු, පදිංචිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු එසේ වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

ගනු ලබන යම් පියවරක කාර්යක්ෂමතාවය අඩුකිරීම.

**9.** (1) (අ) යම් පරිශ්‍රයක සිදු කරනු ලබන හෝ පිළිපදිනු ලබන යම් මදුරු නාශක පියවර අඩාල කරවීමට ඉඩ ඇති ; හෝ

(ආ) යම් පරිශ්‍රයක සිදු කරනු ලබන හෝ පිළිපදිනු ලබන යම් මදුරු නාශක පියවරවල කාර්යක්ෂමතාවය අඩු කිරීමට ඉඩ ඇති,

යම් ක්‍රියාවක්, අවස්ථාවෝචිත පරිදි එවැනි පියවර පරිශ්‍රයේ අයිතිකරු හෝ පදිංචිකරු හෝ නිසි බලධරයා විසින් සිදු කරනු හෝ පිළිපදිනු ලැබුව ද, එම අයිතිකරු හෝ පදිංචිකරු හෝ වෙනත් යම් තැනැත්තකු වි සින් දැන දැනම හෝ සිතාමතා නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් අයිතිකරුවකු, පදිංචිකරුවකු හෝ වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු එසේ වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම, ඔහු යටත් විය යුතු ය.

සම අයිතිකරුවන් සහ සම පදිංචිකරුවන් වෙන් වෙන් වශයෙන් යටත් විය යුතු බව.

**10.** යම් පරිශ්‍රයක එක් තැනැත්තකුට වඩා වැඩි සංඛ්‍යාවක් පදිංචිව සිටින විට හෝ යම් දේපළක් එක් තැනැත්තකුට වඩා වැඩි පිරිසකට හවුලේ අයිතිව පවතින විට, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා, මේ පනත මගින් හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම අතපසු කිරීම හෝ පැහැර හැරීම වෙනුවෙන්, එවැනි එක් එක් පදිංචිකරුවන් සහ එක් එක් අයිතිකරුවන්, වෙන් වෙන් වශයෙන් වගකීමට යටත් විය යුතු ය.

සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා ආරක්ෂාව.

**11.** සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා පරිශ්‍රයක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකුට එරෙහිව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

කාණු, ඇළවල් ආදිය නඩත්තු කිරීමට නියමව ඇති පළාත් පාලන අධිකාරීන් විසින් ඒවා නඩත්තු කිරීම පැහැර හැරිය විට ඔවුන් වෙත විධාන නිකුත් කළ යුතු බව.

**12.** (1) පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් තුළ පිහිටා ඇති සහ එම පළාත් පාලන ආයතනය විසින් යථා පරිදි පවත්වාගෙන යාමට නියම කරනු ලැබ ඇති යම් කාණුවක්, ඇළක්, දිය පහරක් හෝ වගුරු බිමක්, එසේ යථා පරිදි පවත්වාගෙන යාම එම පළාත් පාලන ආයතනය විසින් පැහැර හැරීම හෝ අතපසු කිරීම නිසා එම ස්ථානය මදුරුවන් බෝවීමට හිතකර ස්ථානයක් බවට පත් වී ඇතැයි සොයා ගනු ලැබූ අවස්ථාවක, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සහ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය හෝ උචිත යයි නිසි බලධරයා විසින් සලකනු ලබන විධාන නිකුත් කිරීමේ බලය, ඔහුට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් විධානයකට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හරින යම් පළාත් පාලන ආයතනයක් මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, එම වරද සඳහා වූ නඩු පැවරීමක් නිසි බලධරයා විසින් එම පළාත් පාලන ආයතනයේ සභාපතිවරයාට එරෙහිව හෝ එම පළාත් පාලන ආයතනය වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අදාළ යම් නීතියක් යටතේ පත් කරන ලද වෙනත් යම් නිසි බලධරයකුට එරෙහිව, ගොනු කරනු ලැබිය යුතු ය.

ඇතුළු වී පරීක්ෂා කිරීමේ බලය.

**13.** (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, නිසිබලධරයාට යම් සාධාරණ වේලාවක් තුළ දී යම් පරිශ්‍රයකට ඇතුළු වී —

(අ) (i) එම පරිශ්‍රයේ පදිංචිකරු හෝ අයිතිකරු විසින් මේ පනතේ 2 වන වගන්තිය මගින් පවරන ලද කාර්යයන්ට අනුකූලව ක්‍රියා කරන්නේ ද යන්න ; හෝ

(ii) මදුරුවන් බෝවීම නැවැත්වීම හෝ බෝවීම වැළැක්වීම සඳහා යම් පියවර ගැනීම අවශ්‍ය ද, එසේ අවශ්‍ය නම් ඒවා අවශ්‍ය වන්නේ කොතරම් දුරට ද යන්න,

නිශ්චය කිරීමේ කාර්ය සඳහා යම් සමීක්ෂණයක් කිරීමට, පරීක්ෂා කිරීමට හෝ සෝදිසි කිරීමට ;

(ආ) මේ පනතේ 5 වන වගන්තිය යටතේ කරගෙන යාමට නියමිත යම් කාර්යයක් හෝ වැඩ පිළිවෙලක් ක්‍රියාවෙහි යෙදවීමට,

නිසි බලධරයාට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ සෝදිසි කිරීමක් සිදු කිරීමේ කාර්ය උදෙසා පරිශ්‍රයකට ඇතුළුවීම සඳහා —

(i) අදාළ පරිශ්‍රය ආගමික සිද්ධස්ථානයක් හෝ මහජනතාවට විවෘත කර නොමැති ස්ථානයක් වන අවස්ථාවක, එම පරිශ්‍රය භාරව සිටින තැනැත්තාගෙන් හෝ වෙනත් යම් බලය ඇති තැනැත්තකුගෙන් ; හෝ

(ii) අදාළ පරිශ්‍රය පෞද්ගලික වාසස්ථානයක් වශයෙන් භාවිත කරනු ලබන අවස්ථාවක, එම වාසස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරුගෙන්,

ලිඛිත කැමැත්ත ලබා ගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලබා ගැනීමට නියමිත කැමැත්ත අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක සහ මේ පනත යටතේ පනවා ඇති යම් නියමයකට අනුකූලව ක්‍රියා නොකරන බව සැක කිරීමට හේතු ඇති බවට නිසි බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම පරිශ්‍රයට හෝ පෞද්ගලික වාසස්ථානයට ඇතුළුවීමේ කාර්ය සඳහා නිසි බලධරයා විසින් මහෙස්ත්‍රාත් අධිකරණයෙන් සෝදිසි වරෙන්තුවක් ලබා ගත හැකි අතර, එම සෝදිසි වරෙන්තුව මගින් ඔහු වෙත පවරා ඇති බලතල සියල්ලම හෝ ඉන් යම් බලයක් ක්‍රියාත්මක කළ යුතු ය.

නිසි බලධරයා සහ ඔහු විසින් බලය පැවරීම.

14. (1) මේ පනතේ කාර්ය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නිසි බලධරයා විය යුතු අතර, මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමට ඔහු වගබලා ගත යුතු ය.

(2) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය යයි සහ යෝග්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක, මේ පනත මගින් ඔහු වෙත පවරා ඇති යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා යම් ප්‍රදේශයක සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකුට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට බලතල පැවරිය හැකි අතර, එසේ කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකුට ද, එම නිලධරයා විසින් නිසි බලධරයාගේ පාලනයට සහ අධීක්ෂණයට යටත්ව එම කාර්ය සහ කර්තව්‍ය ඉටු කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් එසේ පවරන ලද කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක

කිරීමේ දී සහ ඉවුට කිරීමේ දී, මේ පනතේ 13 වන වගන්තිය යටතේ නිසි බලධරයාට ලබා දී ඇති පරිදිම ඇතුළුවීමේ සහ පරීක්ෂා කිරීමේ බලතල ක්‍රියාත්මක කළ යුතු අතර, එම නිලධරයාට කරන ලද බාධාවක්, මේ පනතේ 8 වන වගන්තිය යටතේ වරදක් වන්නේ ය.

(4) මේ පනතේ විධිවිධාන සහ ඒවා යටතේ සාදන ලද යම් නියෝගයක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නිසි බලධරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන විධාන, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකුට දිය හැකි අතර, එසේ විධාන ලැබූ සෑම නිලධරයකු විසින් ම, ඒවාට අනුකූලව ක්‍රියා කළ යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

වැරදි, සංජ්ඥෙය වැරදි විය යුතු බව.

**15**. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම එම පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංජ්ඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ නඩු පැවරීම සඳහා අවසර ලබා ගත යුතු බව.

**16**. නිසි බලධරයාගේ අවසරය ඇතිව මිස හෝ සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන වරද සිදුකර ඇත්තේ යම් ප්‍රදේශයක ද, එම ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ අවසරය ඇතිව මිස, මේ පනත යටතේ වූ යම් වරදක් සඳහා නඩු පැවරීමක් නොකළ යුතු ය.

නඩු පැවරීමේ කාර්ය පටිපාටිය.

**17**. (1) යම් පරිශ්‍රයක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති බවට සොයා ගනු ලබන අවස්ථාවක නඩු පැවරීමක් සිදු කිරීමට පෙර, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් වරද සිදු කර ඇතැයි කියනු ලබන තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් යවමින්, එම දැන්වීමේ සඳහන් නිවැරදි කිරීමේ පියවර එය ලැබී සති දෙකක් ඇතුළත පිළිපදින ලෙස හෝ ඉටු කරන ලෙස එම තැනැත්තාට නියම කරනු ලැබිය යුතු ය. මේ උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ තැනැත්තකු විසින්, නියමිත නිවැරදි කිරීමේ පියවර ඉටු කිරීම හෝ පිළිපැදීම සඳහා කාලය දීර්ඝ කිරීමක් ලබා දෙන ලෙස ඉල්ලුම් කළ හැකි අතර, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විමසා එම කාලය දීර්ඝ කිරීම ලබා දීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළ හැකි ය. සති දෙකකට වඩා වැඩිපුර කාලයකට දීර්ඝ කිරීමක් ලබා නොදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමිත නිවැරදි කිරීමේ පියවර ඉටු කිරීම හෝ පිළිපැදීම සඳහා ලබා දී ඇති කාලසීමාව අවසන් වීමෙන් පසු, දැන්වීම යවන ලද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් ඉටු කරන

ලද හෝ ගන්නා ලද පියවර පරීක්ෂා කළ යුතු අතර, එසේ පරීක්ෂා කිරීම සිදු කර සතියක් ඇතුළත පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, ඔහු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ චූදිත තැනැත්තාට එරෙහිව නඩු පවරන ලෙස නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(3) නඩු පවරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් නිර්දේශ කරනු ලබන අවස්ථාවක, සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් මේ වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, එම නිර්දේශය තමා වෙත ලැබී සතියක් ඇතුළත එසේ නඩු පැවරීම සඳහා අවසර ලබා දිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ නඩු පැවරීම සඳහා නිර්දේශයක් ලැබී ඇත්තේ යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු වෙත ද, එම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින්, එම නිර්දේශය සමග තමා වෙත ලැබී ඇති වාර්තාවේ අන්තර්ගත තොරතුරු පරීක්ෂා කිරීමේ දී නඩු පැවරීම අවශ්‍ය නොවන බවට සලකනු ලබන අවස්ථාවක, එම චූදිතයා විසින් ඉටුකර ඇති හෝ ගෙන ඇති පියවර එම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් පරීක්ෂා කොට, එම කරුණ පිළිබඳව තමාගේ නිර්දේශය නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එම නිර්දේශය තමා වෙත ලැබී සති දෙකක් ඇතුළත නිසි බලධරයා විසින්, චූදිත තැනැත්තාට එරෙහිව නඩු පැවරිය යුතු ද, නැද්ද යන්න පිළිබඳව අවසාන තීරණයකට එළඹිය යුතු ය.

**18**. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ සාම නිලධරයන් වෙත පවරා ඇති යම් බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, නිසි බලධරයා සහ ඔහුගේ කාර්ය සහ කර්තව්‍ය පවරා ඇති වෙනත් යම් තැනැත්තකු විසින් එම කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව, සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය. නිසි බලධරයා ආදීන් සාම නිලධරයන් විය යුතු බව.

**19**. මේ පනතේ 3 වන, 7 වන හෝ 17 වන වගන්ති යටතේ යම් පරිශ්‍රයක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු වෙත භාර දිය යුතු දැන්වීමක්, එම අයිතිකරු හෝ පදිංචිකරු වෙත පෞද්ගලිකව භාරදීම මගින් හෝ එම පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීම මගින් සිදු කළ හැකි ය. දැන්වීම් භාරදීම.

**20**. මේ පනතේ විධිවිධාන ජනරජයට සහ ශ්‍රී ලංකා ආණ්ඩුවේ කවර හෝ අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට අදාළ වන අතර, ජනරජය සහ එකී අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව එම විධිවිධානවලින් බැඳී සිටී. මේ පනත මගින් ජනරජය බැඳී සිටින බව.

මේ පනත යටතේ සිදු කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**21**. මේ පනත යටතේ නිසි බලධරයා වෙත පවරා තිබූ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමේ බලය මේ පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකුට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට පවරා ඇති විට, අවස්ථාවෝචිත පරිදි, එම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, එම සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

**22**. මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබූ අවස්ථාවක, එවිට —

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු ;

(ආ) එම පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් නම්, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම ;

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තකු ම ; සහ

(ඈ) එම පුද්ගල මණ්ඩලය පළාත් පාලන ආයතනයක් නම්, එම පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා හෝ එම පළාත් පාලන ආයතනය වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අදාළ යම් නීතියක් යටතේ පත් කරනු ලැබූ යම් නිසි බලධරයකු,

වරදකට වරදකරු වන්නේ ය :

එසේ වුවද, ඉහත (අ), (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් යම් තැනැත්තකු එම වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම නොමැතිව හෝ එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා තමා නිසි සැලකිල්ලෙන් සහ උද්යෝගයෙන් කටයුතු කළ බවට අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම්, එම තැනැත්තා එම වරදට වරදකරුවකු ලෙස නොසැලකිය යුතු ය.

**23**. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ඉටු කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් යම් කරුණක් සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) නිසි බලධරයා විසින් මේ පනත යටතේ යම් අයිතිකරුවකුට හෝ පදිංචිකරුවකුට යැවීමට නියමිත දැන්වීමේ ආකෘතිය පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කිරීම ;

(ආ) මදුරුවන් බෝවීම තුරන් කිරීම සඳහා යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගත යුතු ක්‍රියා මාර්ග සහ පාවිච්චි කළ යුතු පළිබෝධ නාශක වර්ග නිර්දේශ කිරීම ; සහ

(ඇ) මදුරුවන් බෝවීම වැළැක්වීම සහ තුරන් කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මැලේරියා මර්ධන ව්‍යාපාරය සහ වෙනත් සමාන ආයතන වෙනුවෙන් මැලේරියා මර්ධනය පිළිබඳව මාර්ගෝපදේශ නිකුත් කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම නියෝගයේ සඳහන් පසු දිනයක සිට ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(6) යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**24**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

අර්ථ නිරූපණය.

**25**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, (219 වන අධිකාරය වූ) සෞඛ්‍ය සේවා පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

"සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" යන්නෙන්, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තනතුරට පත් කරනු ලැබූ යම් නිලධරයෙක් හෝ එම තනතුරේ වැඩ බලන යම් නිලධරයෙක් අදහස් වන අතර, යම් මහ නගර සභාවක පරිපාලන සීමා ඇතුළත සේවය කරන සහ එම මහ නගර සභා සේවයේ යෙදී සිටින ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, නියෝජ්‍ය ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු අදහස් වේ ;

"පදිංචිකරු" යන්නෙන්, තමා වෙනුවෙන් ම හෝ වෙනත් යම් තැනැත්තකුගේ නියෝජිතයකු වශයෙන් යම් පරිශ්‍රයක භාරය, කළමනාකාරිත්වය හෝ පාලනය භාරව සිටින හෝ එම පරිශ්‍රයේ පදිංචිව සිටින තැනැත්තකු අදහස් වන නමුත්, නවාතැන්කරුවකු ඊට ඇතුළත් නොවේ;

"අයිතිකරු" යන්නට, සම අයිතිකරුවකු, බදුකරුවකු, කවර හෝ අයිතියක් අනුව එම පරිශ්‍රයේ කුලිය හෝ නිෂ්පාදන ලබා ගන්නා තැනැත්තකු සහ එම පරිශ්‍රයේ නියම නඩත්තුව සඳහා වගකිව යුතු යම් තැනැත්තෙක්, ආයතනයක්, සංස්ථාවක් හෝ නිලධරයෙක් ඇතුළත් වේ ;

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක් සහ ඒ මත පිහිටි යම් ගොඩනැගිල්ලක් හෝ ඒ ගොඩනැගිල්ලේ කොටසක් ඇතුළත් වේ ; සහ

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන්, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ එම නිලයට පත් කරනු ලැබූ යම් නිලධරයකු අදහස් වන අතර, ඊට මේ පනත යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු වශයෙන් යම් කර්තව්‍යයක් ඉටු කිරීමට නිසි බලධරයා විසින් බලය පවරන ලද යම් පළාත් පාලන ආයතනයක සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක් ද, ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.